
# ශ්‍රී ලංකාවේ මද්‍යසාර භාවිතය පිළිබඳ ප්‍රවණතා සමීක්ෂණය (2024)

**මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC, Sri Lanka)**

ශ්‍රී ලංකාවේ මද්‍යසාර භාවිතයේ වර්තමාන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා මද්‍යාසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය 1998 සිට වාර්ෂිකව මද්‍යසාර භාවිතය පිළිබඳ ප්‍රවණතා සමීක්ෂණ පවත්වයි. 2024 වර්ෂයේදී කොළඹ, කළුතර, ගාල්ල, පුත්තලම, යාපනය, වවුනියාව, අනුරාධපුර, අම්පාර, මාතලේ, කෑගල්ල සහ බදුල්ල යන දිස්ත්‍රික්ක එකොළහක් පුරා විහිදී ගිය අධ්‍යයනයක් ලෙස මෙම සමීක්ෂණය සිදු කරන ලදී. තෝරාගත් දිස්ත්‍රික්කවල ජීවත් වන වයස අවුරුදු 15 සහ ඊට වැඩි පිරිමි ජනගහනය සමීක්ෂණයට ඇතුළත් කරගන්නා ලදී. වලංගු ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් පුහුණු පරීක්ෂකයින් විසින් දත්ත රැස් කරන ලදී. සහභාගිවන්නන්ගේ ජනවිකාශන තොරතුරු, මද්‍යසාර භාවිතයට සෘජුවම බලපාන සමකාලීන ගැටළු සහ මද්‍යසාර භාවිතයේ රටාවන් පිළිබඳ තොරතුරු සමීක්ෂණයේදී ලබා ගන්නා ලදී.

**සමීක්ෂණයට සහභාගි වූ සියලු දෙනා අතරින් මද්‍යසාර භාවිතා කරන්නන් (වයස අවුරුදු 15 සහ ඊට වැඩි)**

(සමීක්ෂණය පවත්වන අවස්ථාවේ පසුගිය දින 30 තුළ මධ්‍යසාර භාවිතා කළ පුද්ගලයින්).




29.1%


## පසුගිය දශකය තුළ මද්‍යසාර භාවිතයේ සමස්ත ප්‍රවණතාවයේ අඩුවීමක් පෙන්නුම් කරයි.

රජය විසින් මධ්‍යසාර බදු දිගින් දිගටම ඉහල දැමීම, ප්‍රජා බලගැන්වීම් හරහා මද්‍යසාර භාවිතය සතුට සහ නිදහසට බාධාවක් බවට පුද්ගලයන් තුල සිදුව ඇති ආකල්ප වර්ධනය, මද්‍යසාර කර්මාන්තයේ උපක්‍රම පිළිබඳ ජනතාවගේ අවබෝධය දියුණු වීම සහ මද්‍යසාර භාවිතය අවම කිරීම උදෙසා සිදු කෙරෙන විවිධ ප්‍රජා මැදිහත්වීම් මෙම ධනාත්මක ප්‍රවණතාවයට හේතු වී ඇති බව පැහැදිලිය.

**පසුගිය වසර 10 තුළ මද්‍යසාර භාවිතයේ ප්‍රවණතාව (2014 - 2024)**




## මද්‍යසාර සුරාබදු ආදායම සහ සමස්ත මද්‍යසාර නිෂ්පාදනය




| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| මද්‍යසාර සුරාබදු ආදායම (රුපියල් බිලියන) | 122.09 | 137.55 | 169.49 | 181.1 | 223.25 |
| සමස්ථ මද්‍යසාර නිෂ්පාදනය (ලීටර් මිලියන) | 33.49 | 37.46 | 42.24 | 33.93 | 33.50 |

**Source:** Excise Department
**Compiled by :** ADIC

ALCOHOL AND DRUG INFORMATION CENTRE
40/18, Park Road, Colombo 5.
+94 112 584416, +94 112 592515
www.adicsrilanka.org

ADIC
Alcohol and Drug Information Centre

මෙම ප්‍රස්ථාරය 2020 සිට 2024 දක්වා ශ්‍රී ලංකාවේ මුළු මද්‍යසාර සුරාබදු ආදායම (රුපියල් බිලියන) සහ මුළු මද්‍යසාර නිෂ්පාදනයේ (ශුද්ධ මධ්‍යසාර ලීටර මිලියන) ප්‍රවණතා නිරූපණය කරයි (මූලාශ්‍රය: ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ දත්ත).

වසර 2022 න් පසු මුළු මද්‍යසාර නිෂ්පාදනයේ තියුණු පහත වැටීමක් සහ මද්‍යසාර සුරාබදු ආදායමේ අඛණ්ඩ වැඩිවීමක් මෙම දත්ත මගින් පෙන්නුම් කෙරේ.

මෙය රජය විසින් මද්‍යසාර නිෂ්පාදන සඳහා සුරාබදු අඛණ්ඩව වැඩි කිරීම මගින් ලැබුණු ධනාත්මක ප්‍රතිඵලයකි (2023 ජුනි මාසයේදී 20% ක වැඩිවීමක්, 2024 ජනවාරි මාසයේදී 14% ක වැඩිවීමක් සහ 2025 ජනවාරි මාසයේදී 6%ක වැඩිවීමක්). 2022 දී මද්‍යසාර සුරාබදු ආදායම රුපියල් බිලියන 169.49 ක් වූ අතර 2024 දී එය රුපියල් බිලියන 223.25 දක්වා වැඩි වී තිබේ. මෙම ප්‍රවණතාවය පසුගිය වසර කිහිපය තුළ මද්‍යසාර සුරාබදු වලින් රජයේ ආදායමේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි.

ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් නිර්දේශ කර ඇති පරිදි, රටක රාජ්‍ය ආදායම වැඩි කිරීම සහ මද්‍යසාර හානිය අවම කිරීම සඳහා නිවැරදි විද්‍යාත්මක බදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ වැදගත්කම මෙම තත්ත්වය මගින් මනාව පැහැදිලි වේ.

## සමීක්ෂණය පවත්වන අවස්ථාවේ පසුගිය දින 30 තුළ මද්‍යසාර භාවිතා කළ වයස අවුරුදු 15ත් 21ත් අතර ප්‍රතිශතය

**18.0%**

ළමුන් සහ තරුණයන් ඇතුළු සමස්ථ සමස්ත ශ්‍රී ලාංකිකයන් මද්‍යසාර භාවිතයට යොමුවීම අවම කිරීමටත්, මධ්‍යසාර භාවිතයේ සෞඛ්‍ය, සමාජීය සහ ආර්ථික බලපෑම අවම කිරීමටත් පහත සඳහන් යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ දැඩි අවශ්‍යතාවය අප ආයතනය විසින් අවධාරණය කරනු ලබයි.

- ළමුන් සහ තරුණයින් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම් අතර මද්‍යසාර භාවිතයට යොමුවීම වැළැක්වීම අරමුණු කරගත් ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- මද්‍යසාර භාවිතය සහ ප්‍රවර්ධනය අඩු කිරීම සඳහා පවතින නීති සහ ප්‍රතිපත්ති බලාත්මක කිරීම සහ 2019 වසරේ දී කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) පනතට යෝජිත සංශෝධන සම්මත කිරීම කඩිනම් කිරීම.
- සෑම වසරකම උද්ධමනය හා ආර්ථික වර්ධනයට අනුකූලව මද්‍යසාර සඳහා සුරාබදු වැඩි කරන විද්‍යාත්මක බදු සූත්‍රයක් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම.
- තාවකාලික මද්‍යසාර බලපත්‍ර නිකුත් කිරීම සහ සංචාරක කර්මාන්තයේ මුවාවෙන් මද්‍යසාර බලපත්‍ර ලබා දීම නතර කිරීම.
- නීති විරෝධී මද්‍යසාර නිශ්පාදන පාලනය කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම වැඩි දියුණු කිරීම සහ මෙම උත්සාහයන් සඳහා වගකිව යුතු ආයතන ශක්තිමත් කිරීම.
- මද්‍යසාර භාවිතය පිළිබඳ ගැටළු වලට මුහුන පා සිටින පුද්ගලයින්ට සහාය වීම සඳහා උපදේශන, ප්‍රතිකාර සහ අනෙකුත් සහාය සේවා සකස් කර ක්‍රියාත්මක කිරීම.
- පවතින ඵලදායී ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම සහ නව ප්‍රතිපත්ති හඳුන්වා දීම දුර්වල කරන / අවහිර කරන මද්‍යසාර කර්මාන්ත මැදිහත්වීම් වැළැක්වීම.

**සමීක්ෂණයට සහභාගී වූවන්ගෙන් 27.9% ක් සමීක්ෂණය පවත්වන අවස්ථාවේදී මද්‍යසාර භාවිතයෙන් නිදහස් වීමට සමත් වී තිබුණි.**

මද්‍යසාර භාවිතයෙන් නිදහස් වීමට ප්‍රධාන හේතු ලෙස ඉදිරිපත් කර තිබුනේ;

- සෞඛ්‍ය ගැටළු (ඉහළ වයස් කාණ්ඩවල)
- මද්‍යසාර භාවිතය තේරුමක් නැති හැසිරීමක් ලෙස වටහා ගැනීම (අඩු වයස් කාණ්ඩවල)

මෙම ධනාත්මක ප්‍රවණතාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා, මද්‍යසාර භාවිතයේ සෞඛ්‍ය, සමාජීය සහ ආර්ථික බලපෑම් පිළිබඳ දැනුම තවදුරටත් ව්‍යාප්ත කිරීම අත්‍යවශ්‍ය වන අතර, මද්‍යසාර භාවිතයේ ඇති හිස් බව සහ මද්‍යසාර කර්මාන්තයේ උපක්‍රම පිළිබඳව දැනුවත් කිරීම මගින් වැඩි පිරිසක් මද්‍යසාර භාවිතයෙන් නිදහස් කර ගැනීමට දිරි ගැන්වීම කාලීන අවශ්‍යතාවයකි.

මද්‍යසාර භාවිතයෙන් නිදහස් වීමට හේතු වන කරුණු වයස් කාණ්ඩ අනුව වෙනස් වන අතර, එමගින් එක් එක් වයස් කාණ්ඩයන් සමග සිදු කරන මැදිහත්වීම් වලදී ඔවුන්ගේ සුවිශේෂී අවශ්‍යතාවයන් සලකා බැලීමේ වැදගත්කම ඉස්මතු කෙරේ.

## මද්‍යසාර භාවිතයට යොමුවීම කෙරෙහි ඇති ප්‍රබල සමාජ බලපෑම සමීක්ෂණය මගින් ඉස්මතු කර දක්වන අතර, මද්‍යසාර භාවිතා කරන්නන් බොහෝ දෙනෙක් මද්‍යසාර පිළිබඳ ඔවුන්ගේ පළමු අත්දැකීම මිතුරන් සමඟ සිදු වූ බව වාර්තා කරති.

**46.6%**

තාරුණ්‍ය සංකේතවත් කිරීමටත්, එක්ව සතුටු වී තම නිදහස භුක්ති විඳීමටත්, මද්‍යසාර භාවිතය මූලික වන බව ඒත්තුගන්වමින් සමාජ මාධ්‍ය සහ සාම්ප්‍රදායික මාධ්‍ය හරහා සිදු කෙරෙන ප්‍රවර්ධනයන්ගේ බලපෑම මේ සඳහා මූලිකව බලපා ඇත.

මද්‍යසාර කර්මාන්තයේ එබඳු කූඨ උපක්‍රම වලින් ආරක්ෂා වීමටත්, තම සම වයසේ මිතුරන්ගෙන් ඇතිවන පීඩනයට ඔරොත්තු දීමටත් අවශ්‍ය කුසලතා වර්ධනය කර ගැනීමේ ඇති වැදගත්කම ද මෙමගින් අවධාරණය කරනු ලබයි.